00037

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන
අවසාන පරීක්ෂණය - 2018/2019
**ESP2313/STP9613- අධ්‍යාපන පර්යේෂණ ක්‍රම**
කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2019.03.23 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**ප්‍රශ්න අංක 01 සහ තවත් ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.**
**එක් පර්යේෂණ ගැටලුවක් යොදා ගත හැක්කේ එක් ප්‍රශ්නයක පිළිතුරක් සඳහා පමණි.**
**පළමුවන ප්‍රශ්නයට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම ලියා දක්වන්න.**

01. අධ්‍යාපනය සඳහා වන ජාතික පර්යේෂණ සභාව (NRCE) පහත සඳහන් තේමාවලට අදාලව අධ්‍යාපන ක්ෂේත්‍රය යටතේ පර්යේෂණ ආධාර ලබාදීම සඳහා පර්යේෂණ යෝජනා කැඳවා ඇතැයි සිතන්න. එසේම ඔබගේ ආයතනයේ ප්‍රධානියා එවැනි ආධාර ලබා ගැනීමට පර්යේෂණ යෝජනාවක් සකස් කරන ලෙස ඔබගෙන් ඉල්ලා සිටියේ යැයි ද සිතන්න.

- 10 හා 11 ශ්‍රේණිවල සිසුන්ගේ ගණිතය සාධන මට්ටම දුර්වල වීම.
- ඉගැන්වීම් -ඉගෙනුම් ක්‍රියාවලිය තුළ තොරතුරු හා සංනිවේදන තාක්ෂණය
- පාසල පදනම් කරගත් ගුරුවෘත්තීය සංවර්ධනය
- උසස් පෙළ පන්තිවල සිසුන්ගේ පැමිණීම අඩුවීම.
- ශිෂ්‍ය යහපැවැත්ම හා ඔවුන්ගේ ඉගෙනුම

i. ඉහත දක්වා ඇති තේමාවක් තෝරාගෙන සුවිශේෂී පර්යේෂණ ගැටලුවක් සකස් කරන්න.

තේමාව : ------------------------------------------------------------

පර්යේෂණ ගැටලුව :------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

------------------------------------------------------------

(ලකුණු 10)

ii. ඉහතින් දක්වන ලද ගැටලුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම තහවුරු කිරීමට කරුණු හතරක් **(04)** දක්වන්න.

අ)------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

ආ)------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

ඇ)------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

ඈ)------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

(ලකුණු 04)

iii. ඔබ යෝජනා කළ පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමට සුදුසු පර්යේෂණ පිරි සැලැස්මක් තෝරාගෙන එම තේරීම සාධාරණීකරණය කරන්න.

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

(ලකුණු 06)

iv. ඔබ යෝජනා කරන අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ හා SMART සංකල්පය අන්තර්ගත කරමින් සුවිශේෂී අරමුණු තුනක් **(03)** ලියා දක්වන්න.

ප්‍රධාන අරමුණ :

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

සුවිශේෂී අරමුණු :

I.------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

II.------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

III.------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

(ලකුණු 12 යි.)

V. සුදුසු නියැදිකරණ පිරිසැලැස්මක් යෝජනා කොට එය කෙටියෙන් පැහැදිලි කරන්න.
ගැටලුවට අදාලව දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් දක්වා එය සාධාරණීකරණය කරන්න.

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------

(ලකුණු 08 යි.)

(මුළු ලකුණු 40 යි.)

02. i. කරුණු තුනක් **(03)** ඇසුරෙන් සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම, ප්‍රත්‍යෙක අධ්‍යයන පිරි සැලසුමෙන් වෙන් කර දක්වන්න. (ලකුණු 04)

ii. කාර්ය මූලික පර්යේෂණ පිරිසැලසුමක ප්‍රධාන පියවර නම් කොට සුදුසු නිදසුන් සමග එක් එක් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. ආනුභවික සාක්ෂි දක්වමින් කාර්ය මූලික පර්යේෂණ ගුරුවරුන්ට ප්‍රයෝජනවත් වන ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 06)

iv. අධ්‍යාපන පර්යේෂණ සඳහා සම්පරීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම යොදා ගැනීමේ දී පර්යේෂකයන් මුහුණ දෙන ගැටලු තුනක් **(03)** දක්වන්න. (ලකුණු 04)

03. i. අසම්භාවිත නියැදිකරණය හා සසම්භාවිත නියැදිකරණය පර්යේෂණයක ප්‍රධාන නියැදිකරණ වර්ග දෙකකි. මෙම වර්ග දෙක**(02)** පැහැදිලි කරන්න.(ලකුණු 04)

ii. පර්යේෂණ පිරිසැලසුම් දෙකක් ඇසුරෙන් නියැදිකරණයේ අරමුණ හා පර්යේෂණය ක්‍රියාත්මක කිරීම සඳහා නියැදියක් යොදා ගැනීමේ වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 08)

iii. අධ්‍යාපන පර්යේෂණවල දී ස්ථරගත නියැදිකරණ හා පහසුතා නියැදිකරණ පිරිසැලසුම් පුළුල් ලෙස භාවිත වේ. පර්යේෂණවල දී ස්ථරගත හා පහසුතා නියැදිකරණයන්හි භාවිතය නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. i. ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයන්හි ප්‍රධාන ලක්ෂණ සංසන්දනය කරන්න. (අවම වශයෙන් ලක්ෂණ තුනක් **(03)** ඇසුරෙන්) (ලකුණු 04)

ii. (අ) එක් එක් එළැඹුම සඳහා සුදුසු දත්ත රැස් කිරීමේ උපකරණ දෙකක් **(02)** බැගින් නම් කර එම උපකරණවල සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

(ආ) එක් එක් උපකරණයට අදාලව පර්යේෂකයාගේ සහභාගිත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

iii. දත්ත රැස් කිරීම සඳහා භාවිත කිරීමට පෙර පර්යේෂණ උපකරණයක් වලංගු කර ගැනීම ඉතාමත් වැදගත් වෙයි. උපකරණයක් වලංගු කර ගැනීමේ වැදගත්කම හා ඔබගේ අධ්‍යයනය සඳහා උපකරණ වලංගු කර ගැනීමට යොදා ගන්නා පියවර පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. i. අධ්‍යාපන පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ විවිධ පියවර නිදසුන් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. ගැටලුව පිළිබඳ ප්‍රකාශය ක අරමුණ වන්නේ කියවන්නාට අධ්‍යයනය කරනු ලබන මාතෘකාවේ වැදගත්කම දැක්වීමයි. ගැටලුව පිළිබඳ ප්‍රකාශය ගොඩ නැගීමේ දී පර්යේෂකයෙකු විසින් සැලකිය යුතු සාධක තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. තම පර්යේෂණවල ගැටලු හා ක්‍රමවේදය හඳුනා ගැනීමට පර්යේෂකයෙකුට සාහිත්‍ය විමර්ශනය උදව්වන ආකාරය පරීක්ෂා කරන්න. ඔබගේ අදහස් තහවුරු කිරීමට සුදුසු නිදසුන් යොදා ගන්න. (ලකුණු 08)

06. i. හොඳ පර්යේෂණ වාර්තාවක ඇතුළත් විය යුතු අංග මොනවා ද? නිදසුන් සමග සාකච්ඡා කරන්න. (ලකුණු 06)

ii. පර්යේෂකයන් විසින් "උපුටා ගැනීම්" (text citation) හා "ආශ්‍රිත ග්‍රන්ථ" (references) පර්යේෂණ වාර්තාවල දී භාවිත කෙරේ. මෙම වර්ග දෙක **(02)** නිදසුන් දෙමින් වෙන් කර දක්වන්න. (ලකුණු 06)

iii. පර්යේෂණ වාර්තාවක් ලිවීමේදි පර්යේෂකයකු විසින් කුමන පර්යේෂණ ආචාර ධර්ම අනුගමනය කළ යුතු ද? පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.